කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

නිවේදන අංකය : 02 WWL /20/12/27/02
වර්ණය : රතු

# තද වැසි පිලිබඳ අනතුරු ඇඟවීමේ නිවේදනය

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ, ස්වභාවික විපත් පිළිබඳ පූර්ව අනතුරු ඇඟවීමේ මධ්‍යස්ථානය විසින්
2020 දෙසැම්බර් මස 28 වන දින ප.ව. 02.00 වන තෙක් වලංගු වන පරිදි
2020 දෙසැම්බර් මස 27 වන දින ප.ව. 02.00 ට නිකුත් කරන ලදී.

## ගොඩබිම් ප්‍රදේශ සඳහා

## සැලකිලිමත් වන්න!

දිවයින ආශ්‍රිත පහළ වායුගෝලයේ පවතින කැළඹිලි ස්වභාවය හේතුවෙන් උතුරු, නැගෙනහිර, උතුරු-මැද, මධ්‍යම සහ වයඹ පළාත්වලත් බදුල්ල දිස්ත්‍රික්කයේත් වැසි සහිත කාලගුණ තත්ත්වයේ වැඩි වීමක් ඉදිරි පැය 24 තුලදී බලාපොරොත්තුවේ.

එම ප්‍රදේශවල ඇතැම් ස්ථානවලට මි.මී. 150 ට වැඩි ඉතා තද වැසි ඇතිවිය හැක.

සෙසු ප්‍රදේශවල, විශේෂයෙන් සවස් කාලයේ හෝ රාත්‍රී කාලයේ තැනින් තැන වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇතිවේ. ඇතැම් ස්ථානවලට මි.මී. 75 ට වැඩි තරමක තද වැසි ඇතිවිය හැක.

ගිගුරුම් සහිත වැසි සමග ඇතිවිය හැකි තාවකාලික තද සුළං වලින් සහ අකුණු මඟින් සිදුවන අනතුරු අවම කර ගැනීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස ජනතාවගෙන් කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ.

